# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2307/16 - 2022 නොවැම්බර් මස 23 වැනි බදාදා - 2022.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**
**කැස්බෑව නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතු කොට ගෙන කැස්බෑව නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කැස්බෑව නගර සභාවේ අංක 05 බෝකුන්දර කොට්ඨාසයට තේරී පත්වූ පෝරගේ දොන් කමල් රංජන අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, කැස්බෑව නගර සභාවේ අංක 05 බෝකුන්දර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා යාපා මුදියාන්සේලාගේ ජයරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කැස්බෑව නගර සභාවේ තේරීම්භාර නිලධාරී මාපා මුදියන්සේලාගේ සේන කුමාරසිරි බණ්ඩාර මාපා වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, යාපා මුදියාන්සේලාගේ ජයරත්න, කැස්බෑව නගර සභාවේ අංක 05 බෝකුන්දර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,**
තේරීම්භාර නිලධාරී,
කැස්බෑව නගර සභාව.

2022 නොවැම්බර් මස 23 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ.

EOG 11 - 252/1

1A - G 38130 — 26 (2022/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ අනුරාධපුර මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

අවසර නොලබා සභාවේ අනුගාමී සාමාන්‍ය රැස්වීම් තුනකට සහභාගී නොවීම හේතු කොට ගෙන අනුරාධපුර මහ නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ අනුරාධපුර මහ නගර සභාවේ අංක 01 - පැතිස්පුර කොට්ඨාසයට තේරී පත්වූ මහම්ප දෙල්ගොඩ කංකානමලාගේ විනෝදනී විජේසූරිය අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, අනුරාධපුර මහ නගර සභාවේ අංක 01 - පැතිස්පුර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ජයසිරි මුදියන්සේලාගේ මනිෂා රෝෂිණි බණ්ඩාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

අනුරාධපුර මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී කෙංගාදරන් මුගුන්දන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ජයසිරි මුදියන්සේලාගේ මනිෂා රෝෂිණි බණ්ඩාර, අනුරාධපුර මහ නගර සභාවේ අංක 01 - පැතිස්පුර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. මුගුන්දන්,**
තේරීම්භාර නිලධාරී,
අනුරාධපුර මහ නගර සභාව.

2022 නොවැම්බර් මස 23 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

EOG 11 - 252/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.